# කීර්ති නාම ගැලපීම

- <u>නව හවුල් කරුවෙකු පැමිණීමේදී</u>

1. මුළු කීර්ති නාම කොටස ගැලපීම

ප්‍රාග්දන ගිණුම - හර ( නව අනුපාතය )
        ප්‍රාග්දන ගිණුම - බැර ( පැරණි අනුපාතය )

2. නව හවුල් කරුගේ කීර්ති නාම කොටස ගැලපීම

නව හවුල්කරුගේ ප්‍රාග්දන ගිණුම - හර ( නව හවුල් කරුගේ කීර්ති නාම කොටස )
        පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්දන ගිණුම - බැර ( කැප කල අනුපාතය)

උදා : AB හවුල් ව්‍යාපාරයේ , AB 3:2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වා ගෙන යන ලදී. 2021.12.31 දින C හවුල් ව්‍යාපාරයට බැදෙන ලදී. එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්ති නාමය රු .1,200,000 කට අගය කරන ලදී.

අවශ්‍ය වන්නේ,

ඉහත ක්‍රම දෙක යටතේ කීර්තිනාමය ගිණුම් ගත කිරීමට අදාල ලේජර ගිණුම්.

- <u>හවුල්කරුවෙකු ඉවත් වීමේදී</u>

1. මුළු කීර්ති නාම කොටස ගැලපීම

ප්‍රාග්දන ගිණුම - හර ( නව අනුපාතය )
        ප්‍රාග්දන ගිණුම - බැර ( පැරණි අනුපාතය )

2. ඉවත්වන හවුල්කරුගේ කීර්තිනාම කොටස ගැලපීම

පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්දන ගිණුම - හර ( භුක්ති විදීමේ අනුපාතය)
        ඉවත්වන හවුල්කරුගේ ප්‍රාග්දන ගිණුම - බැර ( ඉවත්වන හවුල්කරුගේ කීර්තිනාම කොටස)

JMCvLearning "your virtual learning partner"

උදා: XYZ හවුල් ව්‍යාපාරයේ හවුල් කරුවන් 3:2:1 ට අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයේ Z 2021.12.31 දිනෙන් හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වීමට තීරණය කරන ලදී. ඉවත් වීමෙන් පසු ලාභ අලාභ 3:2 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වා ගෙන යාමට X හා Y තීරණය කරන ලදී.

අවශ්‍ය වන්නේ,

ඉහත ක්‍රම දෙක යටතේ කිර්තිනාමය ගිණුම් ගත කිරීමට අදාල ලේජර ගිණුම්.

## ප්‍රත්‍යගණන ගිණුම් ගත කිරීම.

- <u>පොත් වල ප්‍රත්‍යගණන අගය සටහන් වන පරිදි ගිණුම් ගත කිරීම</u>.

1. ප්‍රත්‍යාගණන ලාභයක් නම්,

වත්කම් ගිණුම් - හර

ප්‍රත්‍යගණන ගිණුම් - බැර

2. ප්‍රත්‍යාගණන අලාභයක් නම්,

ප්‍රත්‍යගණන ගිණුම් - හර

වත්කම් ගිණුම් - බැර

✓ ප්‍රත්‍යාගණන ගිනුමේ අවසාන ශේෂය,

1. හර නම්,

ප්‍රග්දන ගිණුම - හර ( පැරණි අනුපාතයට )
ප්‍රත්‍යගණන ගිණුම් - බැර

2. බැර නම්,

ප්‍රත්‍යගණන ගිණුම් - හර
ප්‍රග්දන ගිණුම - බැර ( පැරණි අනුපාතයට )

උදා:  ABC හවුල් ව්‍යාපාරයට පහත තොරතුරු අදාල වේ.

| වත්කම | පිරිවැය | සමුච්චිත ක්ෂය | ප්‍රත්‍යගණන අගය |
|---|---|---|---|
| ඉඩම් | 10,000,000 | 0 | 12,000,000 |
| ගොඩනැගිලි | 5,000,000 | 1,000,000 | 6,000,000 |
| මෝටර් රථ | 2,000,000 | 500,000 | 1,000,000 |

2021.12.31 දින ඉහත වත්කම් ප්‍රත්‍යගණනය කරන ලද අතර හවුල්කරුවන් අතර ලාභ අලාභ 3:2:1 ට බෙදා ගනු ලබයි.

අවශ්‍ය වන්නේ,

ගිණුම් ගත කිරීමට අදාල ගිණුම්.

JMC vLearning
"your virtual learning partner